## පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව - දකුණු පළාත

## දකුණු පළාත් සභා පාසල්වල පවතින සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය ගුරු පුරප්පාඩු සඳහා උපාධිධාරීන් ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 වන පන්තියේ 1 (අ) ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා වන විවෘත තරඟ විභාගය - 2023

දකුණු පළාත් සභා පාසල්වල පවතින ශ්‍රී ලංකා ගුරු සේවයේ පුරප්පාඩු සඳහා දකුණු පළාත් රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහය ප්‍රකාරව ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 වන පන්තියේ 1 (අ) ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා මෙම නිවේදනයේ සඳහන් පරිදි සුදුසුකම් සපුරා ඇති දකුණු පළාතේ ස්ථිර පදිංචි උපාධිධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය විෂයයන් සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් මෙම බඳවා ගැනීම සිදු කරන අතර පවතින ප්‍රතිපාදන හා සේවා අවශ්‍යතාවය මත බඳවා ගන්නා සංඛ්‍යාව තීරණය කරනු ලැබේ. ඉදිරියේ දී බඳවා ගැනීම් සම්බන්ධයෙන් ලැබෙන අනුමැතීන්ට යටත්ව 2024.12.31 දින වන තෙක් පවත්නා පුරප්පාඩු සඳහා මෙම විභාගය වලංගු වේ.මෙම තරඟ විභාගයේ ලකුණු සහ ප්‍රායෝගික පරීක්ෂණයේ දී ලබා ගත් ලකුණුවල එකතුව අනුව, ඉහළම ලකුණු ලබා ගත් අයදුම්කරුවන්ගේ මුළු කුසලතාවයේ අනුපිළිවෙල මත බඳවාගැනීම් කටයුතු සිදු කෙරේ.

**2. වැටුප් ක්‍රමය :**

මෙම තනතුරට අදාල මාසික වැටුප් පරිමාණය 2022.01.05 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016(iv) හි ජී-ඊ-1-2016 - ඒ දරණ වැටුප් ඛණ්ඩයට අදාළ රු.31,490 – 6x445 – 7x525 – 2x600 - රු.39,035/- වේ.ඔබ මෙම වැටුප් පරිමාණයේ 14 වන පියවර වන රු.37,835/- වැටුප් තලයේ පිහිටුවනු ලැබේ.

**3. අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :**

3.1. අධ්‍යාපන සුදුසුකම් :

i. ඉගැන්වීම් කාර්යයක් සඳහා පිළිගත් සුවිශේෂී කරන ලද ක්ෂේත්‍රවලට අයත්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක් මඟින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධි පිරිනැමීමේ ආයතනයක් මඟින් හෝ ප්‍රදානය කරනු ලැබූ උපලේඛන 01 හි සඳහන් කර ඇති විෂයයන්ට අදාළ උපාධියක් ලබා තිබිය යුතුය. මෙම උපාධිය අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පෙර වලංගු උපාධියක් විය යුතුය.

සහ

ii. අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දෙවරකට නොවැඩි වාර ගණනකදී මව්බස සහ ගණිතය සඳහා සාමාර්ථයන් සහිතව සම්මාන තුනක් සමඟ විෂයයන් හයක් (06) සමත් වීම. (එක් වතාවක දී අවම වශයෙන් විෂයයන් පහක් (05) සමත්ව තිබිය යුතුය.)

සහ

iii. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී එකවර විෂයයන් තුනක් (03) සහිතව එම විභාගය සමත්ව තිබිය යුතුය.

*ඉතා වැදගත් :* **(අයදුම් පත්‍රය සම්පූර්ණ කිරිමේ දී සැලකිල්ලට ගත යුතුය.)**

- ස්වකීය උපාධිය අනුව ඉල්ලුම් කළ හැකි විෂයයන් පිළිබඳව අයදුම්කරුවන් සැළකිලිමත් විය යුතුය.
- උපාධියට හදාරා ඇති ප්‍රධාන විෂයය/විෂයයන් අනුව පමණක් අදාළ ගුරු පුරප්පාඩු සඳහා ඉල්ලුම් කළ හැකිය.
- ඉල්ලුම් කළ හැක්කේ විෂයයන් **තුනක්** සඳහා පමණි.
- ඉල්ලුම් කළ විෂයය හා මාධ්‍යය කිසිදු හේතුවක් මත පසුව වෙනස් කිරීමට ඉඩ ලබා දෙනු නොලැබේ.
- 1988.08.18 දිනැති 27/88 අංක දරණ "ආබාධිත පුද්ගලයන්ට රැකියා සැපයීම" මැයෙන් නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව ද කටයුතු කරනු ඇත.

3.2 කායික හා මානසික යෝග්‍යතාවය -

සැම අපේක්ෂකයෙකු ම ගුරුවරයෙකු වශයෙන් රාජකාරි ඉටු කිරීමට සරිලන මානසික සහ ශාරීරික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

3.3 වයස

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා 35 ට නොවැඩි විය යුතුය.

3.4 වෙනත් සුදුසුකම් -

I. අයදුම්කරු/අයදුම්කාරිය ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

II. අයදුම්කරු/අයදුම්කාරිය විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

III. පුරප්පාඩු සඳහා ඉල්ලුම් කරන අයදුම්කරු හෝ කලත්‍රයා, අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 03 කට නොඅඩු කාලයක් දකුණු පළාත තුළ ස්ථිර අඛණ්ඩ පදිංචිකරුවන් විය යුතුය.(ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරන ලද පදිංචිය පිළිබඳ සහතිකය (ඩී.එස්.04) මඟින් සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේ දී පදිංචිය සනාථ කළ යුතුය.

IV. බඳවාගැනීම් සිදු කිරීම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් සිදු කරනු ලබන අතර අයදුම්කරුවන් තම මනාපය පරිදි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 05ක් සඳහන් කළ යුතු වේ. ( පළමු වරණය, තම ස්ථිර පදිංචිය සහිත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය විය යුතු ය.)

V. යම් විෂයයකට අදාළ ව කිසියම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක ස්ථිර පදිංචිය සහිත උපාධිධාරීන් අදාළ පුරප්පාඩු පූරණය කිරීම සඳහා ප්‍රමාණවත් නොවන විටක දී පමණක් වෙනත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන්හි අයදුම්කරුවන් පිළිබඳ ව සලකා බලනු ලැබේ.

VI. දකුණු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කළ හැකි විය යුතුය.

4. **සේවා කොන්දේසි :**

I. රාජ්‍ය /පළාත් සභා රාජ්‍ය සේවා පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලටද, දකුණු පළාත් සභා රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති කොන්දේසිවලට ද, එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින් මතුවට කෙරෙන හෝ සංශෝධනවලටද යටත්ව තෝරා ගනු ලබන උපාධිධාරී අපේක්ෂකයින් ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 වන පන්තියේ 1 (අ) ශ්‍රේණියට පත් කරනු ලැබේ.

II. මෙම තනතුර ස්ථිරය.විශ්‍රාම වැටුප් සහිතය.මෙම තනතුරට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණවලට පත්වීම්ලාභීන් යටත් විය යුතුය.

III. මෙම තනතුරට පත් කරනු ලබන්නන් අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් වේ.

IV. දකුණු පළාත් සභා රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයට අනුව උසස්වීම් සිදු කරනු ලැබේ.

V. 2020.10.16 දිනැති රා.ප.ච.18/2020 හා එයට වරින් වර සිදු කරන සංශෝධනයන්ට අනුව නියම කර ඇති පරිදි දෙවන රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාවය ලබා ගත යුතුය.

**5.** බඳවා ගැනීම **:**

5.1. බඳවා ගැනීමේ ක්‍රමය :

2008.07.01 දින සිට ක්‍රියාත්මක දකුණු පළාත් සභා රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා ගුරු සේවයේ ව්‍යවස්ථා සංග්‍රහයේ 7.2.4 වගන්තිය අනුව බඳවා ගැනීම සිදු කරනු ලැබේ.

තෝරා ගැනීම සඳහා ලිඛිත තරග විභාගයක් පැවැත්වේ.

ලිඛිත තරඟ විභාගයේ ඉහළම ලකුණු ලබා ගත් අයගේ අනුපිළිවෙල අනුව ඒ ඒ විෂයයට පළාත තුළ පවතින ගුරු පුරප්පාඩු සංඛ්‍යාව මෙන් තුන් (03) ගුණයක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයෙන් සුදුසුකම් ලබන අයදුම්කරුවන් පසුව ප්‍රායෝගික පරීක්ෂණයට කැඳවනු ලැබේ.

ලිඛිත තරඟ විභාගයේ ලකුණු හා ප්‍රායෝගික පරීක්ෂණයේ දී ලබා ගත් ලකුණුවල එකතුව අනුව ඉහළම ලකුණු ලබා ගත් අයදුම්කරුවන් පවතින පුරප්පාඩු සඳහා තෝරා ගනු ලැබේ. (මේ සඳහා ගුරු සේවා ව්‍යවස්ථාවේ 7.2.4.3.1 වගන්තිය බලපැවැත්වේ.)

මෙම විභාග නිවේදනයේ ප්‍රතිඵල මත සිදුකරනු ලබන බඳවාගැනීම, 2023.06.30 දිනට පවතින පුරප්පාඩු ප්‍රමාණය සඳහා පමණක් වලංගු වේ.

5.2 ලිඛිත තරඟ විභාගය - මෙම විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ.

| විෂයය | උපරිම ලකුණු ප්‍රමාණය | සුදුසුකම් ලැබීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 01. අභියෝග්‍යතා පරීක්ෂණය (කාලය පැය 01යි) | 100 | 40 |
| 02. සාමාන්‍ය දැනීම (කාලය පැය 01යි) | 100 | 40 |

**විෂය නිර්දේශය** :

විෂය අංකය 01 - අභියෝග්‍යතා පරීක්ෂණය

අපේක්ෂකයා සතු ගුරු වෘත්තිය සඳහා වන කුසලතා, තර්කානුකූල බුද්ධිය පිලිබඳ දැනුම මැන බැලීම අරමුණු කොට ගෙන මෙම ප්‍රශ්න පත්‍රය සකසනු ලැබේ. මෙය බහුවරණ හෝ කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්න 50කින් සමන්විත වේ. එම ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතුය.

විෂය අංකය 02 - සාමාන්‍ය දැනීම

ගුරු ක්ෂේත්‍රයට අදාළ ව එම ක්ෂේත්‍රය පිළිබඳව ඇති සාමාන්‍ය දැනුම හා /හෝ දේශීය වශයෙන් සිදු වී ඇති හා සිදුවන අධ්‍යාපන ප්‍රවණතා පිළිබඳ සාමාන්‍ය දැනුම හා අධ්‍යාපන නවීකරණය පිළිබඳ සාමාන්‍ය දැනුම පරීක්ෂා කෙරෙන බහුවරණ හෝ කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්නවලින් සමන්විත වේ. එම ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය

5.3 විභාග පටිපාටිය -

I. මෙම විභාගය සිංහල,දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පැවැත්වේ.
II. සෑම අපේක්ෂකයෙකු ම මෙම විභාගයේ සියලුම ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටිය යුත්තේ එක් භාෂා මාධ්‍යයකිනි. භාෂා මාධ්‍යය සිය පත්වීම් ලැබීමට නියමිත භාෂා මාධ්‍යයම විය යුතුය.
III. අපේක්ෂකයෙකුට ස්වකීය අයදුම්පතෙහි දැක්වෙන භාෂා වෙනස් කිරීමට පසුව අවසර දෙනු නොලැබේ.
IV. සෑම අපේක්ෂකයෙකුම ප්‍රශ්න පත්‍ර දෙකටම (02) පෙනී සිටිය යුතුය.
V. වරක දී බඳවා ගනු ලබන සංඛ්‍යාව පත්වීම් බලධාරියා විසින් තීරණය කරනු ලැබේ.

5.4 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය -

සේවා ව්‍යවස්ථාව හා ඊට අනුකූලව ප්‍රසිද්ධ කරනු ලබන විභාග නිවේදනයේ හෝ පුවත්පත් දැන්වීමේ සඳහන් සුදුසුකම් සපුරා තිබේදැයි පරීක්ෂා කිරීම සහ කායික සුදුසුකම් පරීක්ෂා කිරීම.

5.5 ප්‍රායෝගික පරීක්ෂණය -

ප්‍රායෝගික පරීක්ෂණය වශයෙන් අයදුම්කරු විසින් හඳුනා ගන්නා ලද මාතෘකාවක් යටතේ ඉදිරිපත් කිරීමක් කළ යුතුය. මේ සඳහා පහත පරිදි ලකුණු හිමි වේ.

| අනු අංකය | ප්‍රායෝගික පරීක්ෂණයේ දී ලකුණු ලබා දෙනු ලබන නිර්ණායක | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 01. | අරමුණු හා ප්‍රවිශ්ට වීම. | 05 | 02 |
| 02. | පෞරුෂය හා හඬ පාලනය | 05 | 02 |
| 03. | සන්නිවේදනයේ පැහැදිලි බව | 05 | 02 |
| 04. | කාල කළමනාකරණය | 05 | 02 |
| 05. | ඉදිරිපත් කිරීමේ ශිල්පක්‍රම භාවිතය | 05 | 02 |
| 06. | **මුළු ලකුණු ප්‍රමාණය** | **25** | **10** |

5.6 ප්‍රායෝගික පරීක්ෂණ ක්‍රමවේදය -

I. ප්‍රායෝගික පරීක්ෂණය සඳහා විනාඩි 05කට නොඅඩු කාලයක් ලබා දෙනු ලැබේ.

II. ප්‍රායෝගික පරීක්ෂණයට ලබා ගත හැකි උපරිම ලකුණු ප්‍රමාණය විසි පහකි.(25).

III. ප්‍රායෝගික පරීක්ෂණය සමත් වීම සඳහා එක් එක් නිර්ණායක සඳහා අවම වශයෙන් ලකුණු 2 බැගින් ලබා ගත යුතුය.

IV. ප්‍රායෝගික පරීක්ෂණයේ ඇගයීම් දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් සිදු කරනු ලැබේ.

5.7 නිර්ණායකයන්හි අරමුණු -

I. අරමුණ හා ප්‍රවිශ්ට වීම.
සාර්ථකව පාඩමේ අරමුණ පැහැදිලි කිරිම හා පාඩමට ප්‍රවිශ්ට වීමේ හැකියාව ඇගයීම.

II. පෞරුෂය හා හඬ පාලනය.
ගුරුවරයෙකු ලෙස මනා පෞරුෂයකින් යුතු වීම හා ඉගැන්වීමේ දී මනා ලෙස හඬ පාලනය කිරීමේ ඇති හැකියාව ඇගයීම.

III. සන්නිවේදනයේ පැහැදිලි බව.
ඉගෙනුම් ඉගැන්වීමේ ක්‍රියාවලියේ දී අදාල කරුණු ඵලදායී ලෙස සන්නිවේදනය කිරීමේ හැකියාව ඇගයීම.

IV. කාල කළමණාකරණය.
ලබා දෙනු ලබන කාල සීමාව තුළ අරමුණ කෙරෙහි ළඟා වීමේ කුසලතාවය ඇගයීම.

V. ඉදිරිපත් කිරීමේ ශිල්ප ක්‍රම භාවිතය.
අරමුණ කෙරෙහි ලඟා වීම සඳහා ඉදිරිපත් කිරීමේ ශිල්ප ක්‍රම මනා ලෙස භාවිතා කිරීමේ හැකියාව.

6. විභාග ගාස්තු :

විභාග ගාස්තු ලෙස රු 1200 /- ක මුදලක් මාර්ගගත ව ගෙවිය යුතු වේ.

මාර්ගගත ක්‍රමය ඔස්සේ (VISA හෝ MASTER කාඩ්පත් මඟින් පමණක්) හැර වෙනත් ක්‍රමයක් මඟින් සිදු කරනු ලබන ගෙවීම් කිසිඳු ආකාරයකින් පිළිගනු නොලැබේ. කිසිඳු හේතුවක් මත ගෙවූ විභාග ගාස්තු ආපසු නොගෙවන බවද, එම ගාස්තු වෙනත් කවර හෝ විභාගයක් සඳහා මාරු කිරීමට ඉඩදෙනු නොලබන බවද සැලකිය යුතුය.

7. අයදුම්කළ යුතු පිළිවෙල -

I. සියලුම අයදුම්කරුවන් www.psc.sp.gov.lk යන දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවියට පිවිස අදාළ තොරතුරු ඇතුළත් කර අයදුම්පත පුරවා යොමු කිරීමෙන් (Submit) අනතුරුව අයදුම්පත්‍රය බාගත කිරීම සිදු කළ හැකිය. අයදුම්පත පිරවීමේදී යොමු කර ඇති උපලේඛන 01,02 උපයෝගී කර ගත යුතුය.

II. මාර්ගගත ක්‍රමය ඔස්සේ අයදුම්කර (Online) බාගත කර (Download) නොගන්නා ලද අයදුම්පත් හා පරිගණකය මඟින් සකස් කර මුද්‍රණය කර ගන්නා ලද අයදුම්පත් සියල්ල දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරේ.

III. අසම්පූර්ණ ලෙස තොරතුරු යොමු කර ඇති අයදුම්පත්, මූලික සුදුසුකම් සපුරා නොමැති අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරේ. සම්පූර්ණ කර බාගත කරගන්නා ලද අයදුම්පතෙහි දෘඩ පිටපතක් අයදුම්කරු සතු ව තබාගැනීම අනිවාර්යය වන අතර එය සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු වේ.

IV. අයදුම් කරනු ලබන විෂයය, විෂයය සඳහා මනාප අනුපිළිවෙල සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල අනුපිළිවෙල පසුව වෙනස් කිරීමට කිසිසේත් ඉඩ දෙනු නොලබන අතර එක් අයදුම්කරුවෙකුට ඉදිරිපත් කළ හැක්කේ එක් අයදුම්පතක් පමණි.

V. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම. **(මෙය සම්මුඛ පරීක්ෂණය සඳහා ඉදිරිපත් කිරීමට පමණක් අවශ්‍ය වේ.)**
අයදුම්පතෙහි හා විභාග ප්‍රවේශ පත්‍රයේ අත්සන සහතික කිරීමට බලයලත් අයකු විසින්, අයදුම්කරුගේ අත්සන සහතික කළ යුතුය. අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලය ලත් නිළධාරීවරයෙකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරණ නිලධාරීවරයෙකු, රු.498,960/- ක් හෝ ඊට වැඩි මූලික වාර්ෂික වැටුපක් ලබන රජයේ, පළාත් රාජ්‍ය සේවයේ හෝ මාණ්ඩලික ශ්‍රේණියේ ස්ථිර තනතුරක් දරණ නිළධාරියෙකු, බෞද්ධ විහාරයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ කෙනෙකු, පූජ්‍ය පක්ෂයේ සැලැකිය යුතු තත්ත්වයක් දරන පූජ්‍ය කෙනෙකු හෝ යන අයවලුන්ගෙන් කවරෙකු හෝ ලවා සහතික කරනු ලැබ තිබිය යුතුය.

දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන්ගේ අත්සන අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු වෙනුවෙන් එසේ කිරීමට බලයලත් නිලධාරියෙකු මඟින් සහතික කරනු ලැබ තිබිය යුතු අතර, එම අයදුම්පත සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය.

VI. මාර්ගගත ක්‍රමය මඟින් (Online) අයදුම්පත් යොමු කළ හැකි කාල සීමාව 2023.10.24 දින මධ්‍යම රාත්‍රියෙන් අවසන් වේ.

8. ඉහත කාල සීමාව අවසන් වූ පසු මෙම තරඟ විභාගය සඳහා කිසිදු ලෙසකින්වත් අයදුම් කළ නොහැක.

9. මෙම විභාගය කල් දැමීම, අවලංගු කිරීම හෝ පැවැත්වීමෙන් පසු තෝරා ගැනීම/නොගැනීම හෝ පුරප්පාඩු සංඛ්‍යාව පිළිබඳව අවසන් තීරණය හා මෙම නිවේදනයෙන් ආවරණය නොවන වෙනත් කිසියම් කාරණයක් වෙතොත් ඒ පිළිබඳව තිරණය කිරීමේ අයිතිය ද දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය.

10. අයදුම්පත්‍ර ලද බව අයදුම්කරුවන් වෙත පෞද්ගලික ව දන්වනු නොලැබේ. අයදුම්කරුවන් වෙත විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීම **නොවැම්බර් මස 03 වන දින** දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය වන www.psc.sp.gov.lk ඔස්සේ මාර්ගගත ව සිදු කෙරේ. අයදුම්කරුවන් විසින් එම වෙබ් අඩවියේ ඇති **විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීමේ කවුළුවට** පිවිස තම ජාතික හැඳුනුම්පත් අංකය ඇතුළත් කිරීමෙන් විභාග ප්‍රවේශ පත්‍රය බාගත කර ගත හැකිය. එම විභාග ප්‍රවේශ පත්‍රය A4 ප්‍රමාණයේ කඩදාසියක **දෙපැත්තම** භාවිතා කරමින් මුද්‍රණය කර, අත්සන සහතික කරවා විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු ය. ප්‍රවේශපත්‍රයක් නොමැති කිසිදු අයදුම්කරුවකුට විභාගයට පෙනී සිටීමට අවස්ථාව නොලැබේ. තවද, අයදුම්කරුවන් විභාග ශාලාව තුළදී පෙනී සිටින සෑම ප්‍රශ්න පත්‍රයක් සඳහා ම විභාග ශාලාධිපති සෑහීමට පත් වන පරිදි ස්වකීය අනන්‍යතාවය ඔප්පු කළ යුතු ය. ඒ සඳහා පහත සඳහන් ලියවිලි වලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු ය.

(i.) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත
(ii.) වලංගු විදේශ ගමන් බලපත්‍රය
(iii.) වලංගු රියදුරු බලපත්‍රය

11. විභාග නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා අයදුම්පත මාර්ගගතව යොමු කර ඇති අයදුම්කරුවන් වෙත විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාගය සඳහා අයදුම් කරනු ලබන සියලුම අයදුම්කරුවන් සුදුසුකම් සම්පූර්ණ කර ඇතැයි උපකල්පනය කර විභාගයට පෙනී සිටීමට අවස්ථාව ලබා දෙනු ලැබේ. මෙම විභාගය **2023 නොවැම්බර් 18 වන සෙනසුරාදා** දින **ගාල්ල, අම්බලන්ගොඩ, බද්දේගම, මාතර, අකුරැස්ස, තංගල්ල හා හම්බන්තොට** යන විභාග නගරවලදී පවත්වනු ලැබේ. විභාගයට පෙනී සිටීමට අවස්ථාව ලබා දීම පත්වීමක් ලබා ගැනීමට අවශ්‍ය සියළු සුදුසුකම් සම්පූර්ණ කර ඇති බවට පිළිගැනීමක් වශයෙන් නොසැළකිය යුතු ය. එසේ වුව ද අයදුම්කරු සුදුසුකම් සම්පූර්ණ කර නොමැති බව අනාවරණය වන ඕනෑම අවස්ථාවක දී විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීමේ හා පත්වීම් ලබා දීම ප්‍රතික්ෂේප කිරීමේ බලය දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

12. සාවද්‍ය තොරතුරු සැපයීම
මෙම විභාගයට ඉදිරිපත්වීම සඳහා කිසියම් අයදුම්කරුවකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතරතුර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී ඔහුගේ හෝ ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. තවද, පත්වීමක් ලැබීමෙන් පසුව හෝ කිසියම් අයදුම්කරුවකු විසින් ඉදිරිපත් කරන ලද යම් තොරතුරක් සාවද්‍ය බව දැන ඉදිරිපත් කළ බව පෙනී ගියහොත් ඔහු හෝ ඇය සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

13. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අයදුම්කරුවන් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

14. මෙම නිවේදනයේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්වේ.

15. පත්වීම් ලිපියේ සඳහන් ව ඇති පත්වීම් දින සිට දින 14ක් ඇතුලත වැඩ භාරගැනීම සිදු කළ යුතු අතර, එසේ නොවුනහොත් නැවත දැනුම් දීමකින් තොරව පත්වීම අවලංගු වේ.

## උපලේඛණය 01

පුරප්පාඩු පවතින විෂයයන් හා මාධ්‍යයන් පහතින් දක්වා ඇත. ඒ අනුව ඉල්ලුම් කරනු ලබන විෂයය හා මාධ්‍ය තෝරා ගත යුතු ය.

| *අනු අංකය* | *විෂයය* | *මාධ්‍යය* | | | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|---|---|
| | | *සිංහල* | *දෙමළ* | *ඉංග්‍රීසි* | |
| 01 | ප්‍රාථමික | √ | √ | X | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළ සිංහල / දෙමළ භාෂාව හෝ සිංහල / දෙමළ වාග් විද්‍යාව විෂයය ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ඇති ශාස්ත්‍රවේදී උපාධිය |
| 02 | ඉංග්‍රීසි | √ | √ | X | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළ ඉංග්‍රීසි භාෂාව ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ඇති උපාධියක් හෝ ශාස්ත්‍රවේදී (ඉංග්‍රීසි) විශේෂ උපාධිය TESL (Teaching English as a Second Language) හෝ HND ඉංග්‍රීසි සමඟ ඕනෑම උපාධියක් |
| 03 | නැටුම් (දේශීය) | √ | √ | X | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළ ප්‍රධාන විෂයයක් වශයෙන් නර්තන විෂයය ඇතුළත් වන ලලිත කලාවේදී උපාධිය / සෞන්දර්යය උපාධිය හෝ ශාස්ත්‍රවේදී විශේෂ (නර්තනය) උපාධිය හෝ ප්‍රාසාංගික කලාවේදී (විශේෂ) උපාධිය |
| 04 | නැටුම් (භාරතීය) | X | √ | X | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළ ප්‍රධාන විෂයයක් වශයෙන් භරත නාට්‍යයම් විෂයය ඇතුළත් වන ලලිත කලාවේදී උපාධිය / සෞන්දර්යය උපාධිය හෝ ශාස්ත්‍රවේදී විශේෂ (නර්තනය) උපාධිය හෝ ප්‍රාසාංගික කලාවේදී (විශේෂ) උපාධිය |

| | | | | | |
|---|---|---|---|---|---|
| 05 | සංගීතය(පෙරදිග) | √ | √ | X | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළ ප්‍රධාන විෂයයක් වශයෙන් පෙරදිග සංගීතය විෂයය ඇතුළත් වන ලලිත කලාවේදී උපාධිය / සෞන්දර්යය උපාධිය හෝ ශාස්ත්‍රවේදී විශේෂ (පෙරදිග සංගීතය) උපාධිය හෝ ප්‍රාසාංගික කලාවේදී (විශේෂ) උපාධිය |
| 06 | සංගීතය(අපරදිග) | √ | X | X | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළ ප්‍රධාන විෂයයක් වශයෙන් අපරදිග සංගීතය විෂයය ඇතුළත් වන ලලිත කලාවේදී උපාධිය / සෞන්දර්යය උපාධිය හෝ ශාස්ත්‍රවේදී විශේෂ (අපරදිග සංගීතය) උපාධිය හෝ ප්‍රාසාංගික කලාවේදී (විශේෂ) උපාධිය |
| 07 | සංගීතය (කර්ණාටක) | X | √ | X | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළ ප්‍රධාන විෂයයක් වශයෙන් කර්ණාටක සංගීතය විෂයය ඇතුළත් වන ලලිත කලාවේදී උපාධිය / සෞන්දර්යය උපාධිය හෝ ශාස්ත්‍රවේදී විශේෂ (කර්ණාටක සංගීතය) උපාධිය හෝ ප්‍රාසාංගික කලාවේදී (විශේෂ) උපාධිය |
| 08 | නාට්‍ය හා රංඟ කලාව | √ | X | X | නාට්‍ය හා රංග කලාව ප්‍රධාන විෂයය ලෙස හදාරා ඇති සාමාන්‍ය හෝ විශේෂ උපාධිය |
| 09 | චිත්‍ර | √ | √ | X | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළ ප්‍රධාන විෂයයක් වශයෙන් චිත්‍ර කලා විෂයය ඇතුළත් වන ලලිත කලාවේදී උපාධිය / සෞන්දර්යය උපාධිය හෝ ශාස්ත්‍රවේදී විශේෂ (චිත්‍ර ) උපාධිය |
| 10 | විද්‍යාව | √ | √ | X | ජීව විද්‍යාව / රසායන විද්‍යාව / භෞතික විද්‍යාව ප්‍රධාන විෂයය ලෙස හදාරා ඇති විද්‍යාවේදී සාමාන්‍ය හෝ විශේෂ උපාධිය |
| 11 | ගණිතය | √ | √ | X | ශුද්ධ ගණිතය /ව්‍යවහාරික ගණිතය / සංයුක්ත ගණිතය ප්‍රධාන විෂයය ලෙස හදාරා ඇති විද්‍යාවේදී සාමාන්‍ය හෝ විශේෂ උපාධිය |
| 12 | භූගෝල විද්‍යාව | √ | √ | X | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළ භූගෝල විද්‍යාව විෂයය ප්‍රධාන විෂයක් ලෙස හැදෑරූ ශාස්ත්‍රවේදී උපාධිය |
| 13 | පුරවැසි අධ්‍යයනය | √ | √ | X | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළ ප්‍රජා පාලනය හා පුරවැසි අධ්‍යාපන විෂයය ප්‍රධාන විෂයක් ලෙස හැදෑරූ ශාස්ත්‍රවේදී උපාධිය හෝ මානව විද්‍යාව (විශේෂ) උපාධිය |
| 14 | ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය | √ | √ | X | වාණිජවේදී උපාධිය / වාණිජ විෂයය ධාරාවට අයත් විද්‍යාවේදී උපාධිය / වාණිජ විෂයය ධාරාවට අයත් කළමනාකරණවේදී උපාධිය /වාණිජ විෂයය ධාරාවට අයත් ඕනෑම උපාධියක් ලබා තිබීම |
| 15 | කොරියන් | √ | X | X | කොරියන් භාෂාව ප්‍රධාන විෂයක් ලෙස ලබා ඇති සාමාන්‍ය හෝ විශේෂ උපාධිය |
| 16 | ජපන් | √ | X | X | ජපන් භාෂාව ප්‍රධාන විෂයක් ලෙස ලබා ඇති සාමාන්‍ය හෝ විශේෂ උපාධිය |

| | | | | | |
|---|---|---|---|---|---|
| 17 | දෙවන බස (දෙමළ) | √ | X | X | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළ උපාධියට දෙමළ භාෂාව ප්‍රධාන විෂයයක් ලෙස සමත්ව තිබීම සහ පහත සඳහන් එක් සුදුසුකමක් සපුරා තිබීම<br>අ.පො.ස. (සා/පෙළ) විභාගයේදී හර විෂයයක් ලෙස සිංහල භාෂාවට සම්මාන සාමාර්ථයක් ලබා තිබීම හෝ පිළිගත් විශ්වවිද්‍යාලයක හෝ රජයේ ව්‍යවස්ථාපිත ආයතනයක මාස 06කට නොඅඩු සිංහල භාෂාව පිළිබඳ ඩිප්ලෝමාවක් හදාරා සහතිකයක් ලබා තිබීම. |
| 18 | ගෘහ ආර්ථික විද්‍යාව | √ | X | X | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හෝ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිළිගනු ලබන විශ්වවිද්‍යාලයක ගෘහ විද්‍යාව විෂය සඳහා උපාධිධරයකු වීම. |
| 19 | සිංහල භාෂාව හා සාහිත්‍ය | √ | X | X | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළ සිංහල භාෂාව ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ ශාස්ත්‍රවේදී උපාධිය |
| 20 | දෙමළ භාෂාව හා සාහිත්‍ය | X | √ | X | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළ දෙමළ භාෂාව ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ ශාස්ත්‍රවේදී උපාධිය |
| 21 | ඉතිහාසය | √ | √ | X | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළ ඉතිහාසය / පුරාවිද්‍යාව ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ ශාස්ත්‍රවේදී උපාධිය |
| 22 | සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය | √ | √ | X | ක්‍රීඩා විද්‍යාව හා කළමණාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය හෝ විද්‍යාවේදී ( ශාරීරික අධ්‍යාපන) විශේෂ උපාධිය හෝ ශාරීරික අධ්‍යාපනය හා ක්‍රීඩා ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක් |
| 23 | ගිණුම්කරණය | √ | X | X | ගිණුම්කරණය පිළිබඳ විශේෂ උපාධියක් හෝ ගිණුම්කරණය ප්‍රධාන විෂයයක් වන ඕනෑම උපාධියක් ලබා තිබීම |
| 24 | ව්‍යාපාර අධ්‍යයනය | √ | X | X | ව්‍යාපාර අධ්‍යයනය හෝ ව්‍යාපාර කළමනාකරණයට අදාළ විෂයක් ප්‍රධාන විෂයක් වන ඕනෑම උපාධියක් ලබා තිබීම |
| 25 | ආර්ථික විද්‍යාව | √ | X | X | ආර්ථික විද්‍යාව පිළිබඳ විශේෂ උපාධියක් හෝ ආර්ථික විද්‍යාව ප්‍රධාන විෂයක් වන ඕනෑම උපාධියක් ලබා තිබීම |
| 26 | රසායන විද්‍යාව | √ | X | √ | සිව් අවුරුදු විශේෂ උපාධියක දී ප්‍රධාන විෂය ලෙස හෝ අනෙකුත් විෂයයක් ලෙස උපාධියේ මුළු විෂයය සන්ධාරයෙන් 1/3ක් අ.පො.ස.(උසස් පෙළ) විෂය නිර්දේශයට අනුකූලවන පරිදි හදාරා තිබීම හෝ තුන් අවුරුදු උපාධියකදී මුළු විෂය සන්ධාරයෙන් 1/3ක් අවම වශයෙන් අදාළ විෂයයෙන් සම්පූර්ණ කර තිබිම. |
| 27 | භෞතික විද්‍යාව | √ | X | X | සිව් අවුරුදු විශේෂ උපාධියක දී ප්‍රධාන විෂය ලෙස හෝ අනෙකුත් විෂයයක් ලෙස උපාධියේ මුළු විෂයය සන්ධාරයෙන් 1/3ක් අ.පො.ස.(උසස් පෙළ) විෂය නිර්දේශයට අනුකූලවන පරිදි හදාරා තිබීම හෝ තුන් අවුරුදු උපාධියකදී මුළු විෂය සන්ධාරයෙන් 1/3ක් අවම වශයෙන් අදාළ විෂයෙන් සම්පූර්ණ කර තිබිම. |

| | | | | | |
|---|---|---|---|---|---|
| 28 | ජීව විද්‍යාව | √ | X | X | සිව් අවුරුදු විශේෂ උපාධියක දී ප්‍රධාන විෂය ලෙස උද්භිත විද්‍යාව / ශාක ජීව විද්‍යාව හෝ සත්ව විද්‍යාව හදාරා තිබීම හා ප්‍රධාන විෂය උද්භිත විද්‍යාව / ශාක ජීව විද්‍යාව වන විට අනෙක් විෂයක් ලෙස සත්ව විද්‍යාව ද ප්‍රධාන විෂය සත්ව විද්‍යාව වන විට අනෙක් විෂයක් ලෙස උද්භිත විද්‍යාව / ශාක ජීව විද්‍යාව ද අවම වශයෙන් වසර දෙකක දී වත් උසස් පෙළ විෂයය නිර්දේශයට අනුකූල වන පරිදි හදාරා තිබීම හෝ තුන් අවුරුදු සාමාන්‍ය උපාධියක දී උද්භිත විද්‍යාව / ශාක ජීව විද්‍යාව හා සත්ව විද්‍යාව යන විෂයන් දෙකෙහි ම එකතුව,මුළු විෂය සන්ධාරයෙන් අවම වශයෙන් 1/3 ක බැගින් උසස් පෙළ විෂය නිර්දේශයට අනුකූල පරිදි හදාරා තිබීම. |
| 29 | කෘෂි විද්‍යාව | √ | X | X | විද්‍යාවේ දී කෘෂි තාක්ෂණය හා කළමණාකරණ උපාධිය(B.Sc. Agricultural Technology and Management) |
| 30 | සංයුක්ත ගණිතය | √ | X | X | ශුද්ධ ගණිතය, ව්‍යවහාරික ගණිතය විෂයයක් වශයෙන් හදාරන ලද විද්‍යාවේදී උපාධිය (BSc graduate with Applied, Pure Mathematics as subject) |
| 31 | ඉංජිනේරු තාක්ෂණවේදය | √ | X | X | ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේ දී උපාධිය හෝ ඉංජිනේරු තාක්ෂණවේදය පිළිබඳ තාක්ෂණවේදී උපාධිය |
| 32 | ජෛව පද්ධති තාක්ෂණවේදය | √ | X | X | කෘෂිකර්මය පිළිබඳ විද්‍යාවේ දී උපාධිය හෝ ජෛව පද්ධති තාක්ෂණවේදය පිළිබඳ තාක්ෂණවේදී උපාධිය |
| 33 | තාක්ෂණවේදය සඳහා විද්‍යාව | √ | X | X | භෞතික විද්‍යාව විෂය සඳහා දක්වා ඇති අධ්‍යාපන සුදුසුකම් මෙම විෂය සඳහා ද අදාළ වන අතර, ප්‍රධාන විෂය ලෙස භෞතික විද්‍යාව අනිවාර්යය වේ. අමතර සුදුසුකමක් ලෙස රසායන විද්‍යාව,ජීව විද්‍යාව හදාරා තිබීම සලකා බැලේ. |
| 34 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | √ | √ | X | තොරතුරු තාක්ෂණය උපාධිය හෝ හෝ තොරතුරු තාක්ෂණය ප්‍රධාන විෂයක් ලෙස හැදෑරූ උපාධියක් |
| 35 | සෞඛ්‍ය හා සමාජ ආරක්ෂණය | √ | X | X | සෞඛ්‍ය ප්‍රවර්ධන විද්‍යාවේදී (විශේෂ) උපාධිය හෝ සෞඛ්‍ය හා සමාජ ආරක්ෂණය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක් |
| 36 | ශාරීරික අධ්‍යාපනය හා ක්‍රීඩා | √ | X | X | ක්‍රීඩා විද්‍යාව හා කළමණාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය හෝ විද්‍යාවේදී ( ශාරීරික අධ්‍යාපන) විශේෂ උපාධිය හෝ ශාරීරික අධ්‍යාපනය හා ක්‍රීඩා ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක් |
| 37 | ප්‍රාසාංගික කලාව | √ | X | X | ප්‍රාසාංගික කලාව පිළිබඳ විශේෂ උපාධිය හෝ ශාස්ත්‍රවේදී - විශේෂ (ප්‍රාසාංගික කලා / ලලිත කලා / නර්තනය / සංගීත) උපාධිය හෝ අධ්‍යාපනවේදී (නාට්‍ය හා රංගකලාව) උපාධිය හෝ ප්‍රාසාංගික කලාව හෝ ලලිත කලාව ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ විශේෂ උපාධියක් |

| | | | | | |
|---|---|---|---|---|---|
| 38 | කාර්ය සිද්ධි කළමණාකරණය | √ | X | X | ආගන්තුක සත්කාර, සංචාරක ව්‍යාපාර සහ කාර්ය සිද්ධි කළමනාකරණය පිළිබඳ කළමනාකරණ උපාධිය හෝ කාර්ය සිද්ධි කළමනාකරණය ප්‍රධාන විෂයයක් ලෙස ඇතුළත් උපාධියක් |
| 39 | ශිල්ප කලා | √ | X | X | දෘශ්‍ය කලා විශේෂ උපාධිය ( චිත්‍ර, මූර්ති, මුද්‍රණ කලා, රෙදිපිළි හා රෙදිපිළි ආශ්‍රිත කලා ආදී) හෝ දෘශ්‍ය කලා සැලසුම්කරණය විශේෂ උපාධිය (චිත්‍ර කලා සහ ග්‍රැෆික්) හෝ දෘශ්‍ය හා තාක්ෂණ කලා විශේෂ උපාධිය හෝ ශාස්ත්‍රවේදී හෝ ලලිත කලාවේදී හෝ විශේෂ උපාධිය - (චිත්‍ර කලා / ග්‍රැෆික් /මූර්ති / දෘශ්‍ය හා තාක්ෂණික කලා යන විෂයයන් හෝ එක් විෂයයක් හෝ ප්‍රධාන විෂය ලෙස හදාරා තිබිය යුතුය.) |
| 40 | අභ්‍යන්තර නිර්මාණකරණය | √ | X | X | ගෘහ නිර්මාණ ශිල්පය සඳහා වූ විද්‍යාවේදී උපාධිය හෝ නිර්මාණවේදී උපාධිය හෝ ගෘහ නිර්මාණ ශිල්පය සඳහා පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිය හෝ අභ්‍යන්තර නිර්මාණකරණය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක් |
| 41 | විලාසිතා නිර්මාණකරණය | √ | √ | X | නිර්මාණවේදී උපාධිය හෝ දෘශ්‍ය කලා විශේෂ උපාධිය (රෙදිපිළි හා ඇඟලුම් කලා) හෝ විලාසිතා නිර්මාණය සහ නිපැයුම් ප්‍රවර්ධනය පිළිබඳ පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිය හෝ විලාසිතා නිර්මාණකරණය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක් |
| 42 | ග්‍රැෆික් නිර්මාණකරණය | √ | X | X | නිර්මාණවේදී උපාධිය හෝ දෘශ්‍ය කලා හා සැලසුම්කරණය පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධිය ( චිත්‍ර සහ ග්‍රැෆික්) හෝ පරිගණක ඉංජිනේරු ශිල්පය පිළිබඳ ඉංජිනේරු විද්‍යාවේදී උපාධිය හෝ පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය හෝ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය හෝ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණවේදී උපාධිය හෝ උපාධියට ප්‍රධාන විෂයයක් ලෙස තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂයය ඇතුළත් උපාධියක් හෝ පරිගණක විද්‍යාව විෂයය ඇතුළත් විද්‍යාවේදී උපාධිය හෝ(ඉහත සඳහන් උපාධි පාඨමාලාවෙන් 1/3 ක වටිනාකමකින් යුත් ග්‍රැෆික් නිර්මාණකරණය සහිත විෂයය කොටස් හදාරා සමත් වී තිබිය යුතුය.) ග්‍රැෆික් නිර්මාණකරණය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක් |
| 43 | භූ දර්ශන නිර්මාණකරණය | √ | X | X | කෘෂිකර්මය පිළිබඳ විශේෂ උපාධිය (උද්‍යාන විද්‍යාව විශේෂීකරණය සහිතව) හෝ උද්‍යාන විද්‍යාව, මල් වගාව හා භූ දර්ශනය පිළිබඳ ප්‍රථම උපාධිය |
| 44 | පශු සම්පත් නිශ්පාදන තාක්ෂණ අධ්‍යයනය | X | √ | X | කෘෂිකර්මය පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය (සත්ව විද්‍යාව විශේෂීකරණය සහිතව) හෝ සත්ත්ව පාලනය හා මත්ස්‍ය විද්‍යාව පිළිබඳ ප්‍රථම උපාධිය හෝ සත්ත්ව පාලනය පිළිබඳ විද්‍යාවේදී උපාධිය හෝ පශු සම්පත් නිශ්පාදන තාක්ෂණය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක් |

| | | | | | |
|---|---|---|---|---|---|
| 45 | ආහාර නිශ්පාදන තාක්ෂණ අධ්‍යයනය | √ | X | X | ආහාර විද්‍යාව හා තාක්ෂණවේදය ප්‍රථම උපාධිය හෝ ආහාර විද්‍යා තාක්ෂණය විශේෂ උපාධිය හෝ ආහාර විද්‍යා පෝෂණය පිළිබඳ ප්‍රථම උපාධිය හෝ විද්‍යාවේදී ප්‍රථම උපාධිය සමඟ ආහාර විද්‍යා තාක්ෂණ විද්‍යාපති උපාධිය හෝ කෘෂි විද්‍යාවේදී ආහාර විද්‍යා තාක්ෂණය විශේෂ උපාධිය ( මුළු විෂයය මාලාවේ 60% නොඅඩු ආහාර විද්‍යාව හා තාක්ෂණවේදයට සම්බන්ධ විෂය අන්තර්ගතයක් තිබිය යුතුය.) විද්‍යාවේදී ආහාර විද්‍යා තාක්ෂණ විශේෂ උපාධිය (මුළු විෂයය මාලාවේ 60% නොඅඩු ආහාර විද්‍යාව හා තාක්ෂණවේදයට සම්බන්ධ විෂය අන්තර්ගතයක් තිබිය යුතුය.) කෘෂිකර්මය පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය ( ආහාර විද්‍යාව හා තාක්ෂණ විශේෂීකරණය සහිතව) හෝ ආහාර නිශ්පාදන තාක්ෂණය හෝ ආහාර සැකසුම් තාක්ෂණවේදී උපාධියක් |
| 46 | ජලජ සම්පත් තාක්ෂණ අධ්‍යයනය | √ | X | X | කෘෂිකර්මය පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය (ජලජීවී විද්‍යාව පිළිබඳ විශේෂීකරණය සහිතව) හෝ ජලජ සම්පත් කළමනාකරණය හා සත්ත්ව විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය හෝ සත්ත්ව පාලනය හා මත්ස්‍ය විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය හෝ උපාධියට ප්‍රධාන විෂයයක් ලෙස ජලජ සම්පත් කළමනාකරණය විෂයය ඇතුළත් ප්‍රථම උපාධිය හෝ ජලජ සම්පත් තාක්ෂණය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක් |
| 47 | ඉදිකිරීම් තාක්ෂණ අධ්‍යයනය | √ | √ | X | සිවිල් ඉංජිනේරු ශිල්පය පිළිබඳ ඉංජිනේරු විද්‍යාවේදී උපාධිය හෝ ඉදිකිරීම් හා ගොඩනැගිලි සේවා තාක්ෂණවේදය ඇතුළත් ඉංජිනේරු තාක්ෂණවේදී උපාධිය හෝ තාක්ෂණවේදී උපාධිය හෝ ඉදිකිරීම් තාක්ෂණය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක් |
| 48 | මෝටර් යාන්ත්‍රික තාක්ෂණ අධ්‍යයනය | √ | X | X | තාක්ෂණවේදී උපාධිය (මෝටර් යාන්ත්‍රික) හෝ විද්‍යාවේදී ඉංජිනේරු (මෝටර් යාන්ත්‍රික) උපාධිය හෝ මෝටර් යාන්ත්‍රික තාක්ෂණය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක් |
| 49 | විදුලිය හා ඉලෙක්ට්‍රොනික තාක්ෂණ අධ්‍යයනය | √ | √ | X | විදුලි හා විද්‍යුත් ඉංජිනේරු ශිල්පය පිළිබඳ ඉංජිනේරු විද්‍යාවේදී උපාධිය හෝ ඉංජිනේරු තාක්ෂණවේදී උපාධිය හෝ ව්‍යවහාරික ඉලෙක්ට්‍රොනික විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය හෝ විදුලිය හා ඉලෙක්ට්‍රොනික තාක්ෂණය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක් |
| 50 | පේෂකර්ම හා ඇඟලුම් තාක්ෂණ අධ්‍යයනය | √ | X | X | නිර්මාණවේදී උපාධිය හෝ පේෂකර්ම හා රෙදිපිළි පිළිබඳ ඉංජිනේරු ප්‍රථම උපාධිය හෝ තාක්ෂණවේදී උපාධිය හෝ පේෂකර්ම හා ඇඟලුම් තාක්ෂණය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක් |
| 51 | ලෝහ සැකසුම් තාක්ෂණ අධ්‍යයනය | √ | X | X | තාක්ෂණවේදී උපාධිය යාන්ත්‍රික (සාමාන්‍ය) හෝ යාන්ත්‍රික තාක්ෂණවේදය (සාමාන්‍ය) ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධිය හෝ ලෝහ සැකසුම් තාක්ෂණය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක් |
| 52 | ඇලුමිනියම් පිරිසැකසුම් තාක්ෂණ අධ්‍යයනය | √ | X | X | තාක්ෂණවේදී උපාධිය (සිවිල් / ඉදිකිරීම් / යාන්ත්‍රික) හෝ ඇලුමිනියම් පිරිසැකසුම් තාක්ෂණය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක් |

| | | | | | |
|---|---|---|---|---|---|
| 53 | පරිගණක දෘඩාංග සහ ජාලකරණය | √ | √ | X | වසර තුනක කාලයකින් යුක්ත තොරතුරු තාක්ෂණය, පරිගණක විද්‍යාව / පරිගණක ඉංජිනේරු විද්‍යාව පිළිබඳ උපාධිය (එම උපාධිය සඳහා පහත සඳහන් විෂය ක්ෂේත්‍රයන්ට අදාලව මුළු උපාධි පාඨමාලාවෙන් 1/5 ක වටිනාකමක් සහිත විෂයය කොටස් හදාරා සමත් වී තිබීම.)හෝ වසර හතරක කාලයකින් යුක්ත තොරතුරු තාක්ෂණය ,පරිගණක විද්‍යාව /පරිගණක ඉංජිනේරු විද්‍යාව පිළිබඳ උපාධිය (එම උපාධිය සඳහා පහත සඳහන් විෂයය ක්ෂේත්‍රයන්ට අදාළ මුළු උපාධි පාඨමාලාවෙන් 15%ක වටිනාකමක් සහිත විෂය කොටස් හදාරා සමත් වී තිබීම.) හෝ පරිගණක විද්‍යාව ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ඇති විද්‍යාවේදී /තාක්ෂණවේදී /උපාධිය සමඟ තොරතුරු තාක්ෂණය / පරිගණක තාක්ෂණය /පරිගණක දෘඩාංග / පරිගණක ජාලකරණය පිළිබඳ පශ්චාත් උපාධිය (එම පශ්චාත් උපාධිය සඳහා මුළු විෂය කොටස්වලින් 1/5 ක වටිනාකමක් සහිතව පහත සඳහන් විෂය ක්ෂේත්‍ර හදාරා සමත් වී තිබීම.)<br>විෂය ක්ෂේත්‍ර<br>i) Computer Hardware<br>ii) Computer system<br>iii) Computer Networks<br>iv) Computer Architecture<br>v) Operating System<br>vi) Electronics<br>vii) Arduino Technology<br>viii) IT Security Engineering<br>ix) Network Security<br>x) Information Security<br>xi) Cyber Security<br>xii) Computer Hardware and Network related |
| 54 | නිෂ්පාදනය | √ | X | X | වසර තුනක කාලයකින් යුත් යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ උපාධියක් |
| 55 | සංචරණය හා ආගන්තුක සත්කාර | √ | √ | X | ආගන්තුක සත්කාර හා විවේක කළමනාකරණය පිළිබඳව පරිපාලනවේදී උපාධිය හෝ විද්‍යාවේදී සංචාරක කළමනාකරණ විශේෂ උපාධිය හෝ විද්‍යාවේදී සත්කාරක සේවා කළමනාකරණ විශේෂ උපාධිය හෝ ආගන්තුක සත්කාර සංචාරක ව්‍යාපාර සිද්ධි පිළිබඳ කළමනාකරණ උපාධිය හෝ සංචාරක කළමනාකරණ විශේෂවේදී උපාධිය හෝ සංචාරක කළමනාකරණ උපාධිය හෝ සංචාරක සහ සංස්කෘතික සම්පත් කළමනාකරණ උපාධිය හෝ සංචරණය හා ආගන්තුක සත්කාර ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධියක් |
| 56 | විශේෂ අධ්‍යාපනය | √ | X | X | විශේෂ අධ්‍යාපනය පිළිබඳ උපාධියක් හෝ අන්තර්ක්‍රියාකාරී අධ්‍යාපනය පිළිබඳ උපාධියක් හෝ කථනය සහ ශ්‍රවණය පිළිබඳ උපාධියක් |

උපලේඛණය 02

අයදුම්කරුවන් විසින් තෝරා ගත යුතු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන්

| **අනු අංකය** | **ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය** |
|---|---|
| 101 | අක්මීමණ |
| 102 | අම්බලන්ගොඩ |
| 103 | බද්දේගම |
| 104 | බලපිටිය |
| 105 | බෙන්තොට |
| 106 | බෝපේ - පෝද්දල |
| 107 | ඇල්පිටිය |
| 108 | ගාල්ල |
| 109 | ගෝනාපීනුවල |
| 110 | හබරාදූව |
| 111 | හික්කඩුව |
| 112 | ඉමදූව |
| 113 | කරන්දෙණිය |
| 114 | නාගොඩ |
| 115 | නෙළුව |
| 116 | නියාගම |
| 117 | තවලම |
| 118 | වැලිවිටිය - දිවිතුර |
| 119 | යක්කලමුල්ල |
| 120 | වඳුරඹ |
| 121 | රජ්ගම |
| 122 | මාදම්පාගම |
| 123 | අකුරැස්ස |
| 124 | අතුරලිය |
| 125 | දෙවිනුවර |
| 126 | දික්වැල්ල |
| 127 | හක්මණ |
| 128 | කඹුරුපිටිය |
| 129 | කිරින්ද පුහුල්වැල්ල |
| 130 | කොටපොල |
| 131 | මාලිම්බඩ |
| 132 | මාතර |
| 133 | මුලටියන |

| | |
|---|---|
| 134 | පස්ගොඩ |
| 135 | පිටබැද්දර |
| 136 | තිහගොඩ |
| 137 | වැලිගම |
| 138 | වැලිපිටිය |
| 139 | අම්බලන්තොට |
| 140 | අඟුණුකොළපැලැස්ස |
| 141 | බෙලිඅත්ත |
| 142 | හම්බන්තොට |
| 143 | කටුවන |
| 144 | ලුණුගම්වෙහෙර |
| 145 | ඕකෙවෙල |
| 146 | සූරියවැව |
| 147 | තංගල්ල |
| 148 | තිස්සමහාරාමය |
| 149 | වලස්මුල්ල |
| 150 | වීරකැටිය |